ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංක: PS/GPA/Circular/35/2020
2020.11.25

**අමාත්‍යාංශ ලේකම්වරුන්**
**රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්**
**පළාත් ප්‍රධාන ලේකම්වරුන්**
**පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්**
**දිස්ත්‍රික් ලේකම්වරුන්**
**ප්‍රාදේශීය ලේකම්වරුන්**

**<u>නිවෙස්ගත නිරෝධායනය නිරීක්ෂණය කිරීමේ යාන්ත්‍රණය</u>**

දැනට පවතින COVID-19 ගෝලීය වසංගතය පාලනය පිණිස පියවර රාශියක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ තාක්ෂණික උපදෙස් මත රජය විසින් ගනු ලබන අතර රෝග ආශ්‍රිතයන් සඳහා නිවෙස්ගත නිරෝධායනය රෝගය පැතිරීම අවම කිරීම සඳහා ගෙන ඇති ඉතා වැදගත් පියවරකි. එම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා බිම් මට්ටමේ දී නිවෙස්ගතව නිරෝධායනය වන නිවැසියන් විසින් එය අපේක්ෂිත පරිදි ඉටු කරන්නේ දැයි තහවුරු කරනු පිණිස ක්ෂේත්‍ර නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමකට මෙම ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමේ වගකීම පවරා ඇත.

**නිරීක්ෂණ කණ්ඩායමේ සංයුතිය හා සම්බන්ධීකරණය**

ග්‍රාමීය කමිටුවේ නිලධාරීන් වන ග්‍රාම නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ට අමතරව පොලිස් නිලධාරීන් හට මෙම වගකීම පවරා ඇත. මෙම නිලධාරීන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ සමස්ථ තාක්ෂණික අධීක්ෂණය යටතේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සම්බන්ධීකරණය මත නිරීක්ෂණ යාන්ත්‍රණය ක්‍රියාත්මක කල යුතුය.

නිවෙස්ගතව නිරෝධායනය වන පුද්ගලයන් විසින් දින 14ක කාලයක් පුරා එම කාර්යය නිසි පරිදි ඉටු කිරීම නිරීක්ෂණය කල යුතු අතර ඒ සඳහා පහත පරිදි එක් එක් නිලධාරීන් වෙනුවෙන් සතියේ දවස් වෙන් කරනු ලැබේ.

| දවස | නිරීක්ෂණය කරණු ලබන නිලධාරියා |
|---|---|
| සඳුදා | ආර්ථික සංවර්ධන නිලධාරී |
| අඟහරුවාදා | පොලිස් නිලධාරී |
| බදාදා | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර |
| බ්‍රහස්පතින්දා | ග්‍රාම නිලධාරී |
| සිකුරාදා | සමෘද්ධි සංවර්ධන නිලධාරී |
| සෙනසුරාදා | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී |
| ඉරිදා | මහජන සෞඛ්‍ය පරීක්ෂක |

ඒ අනුව නිරෝධායනය වන දින 14 තුල එක් නිලධාරියෙකුට නිවෙස් නිරීක්ෂණය කිරීමට සිදුවන්නේ දින දෙකක් පමණි. නිරෝධායනය සිදුවන කාලය තුල එම පවුලේ සාමජිකයෙකු රෝගියෙකු වුවහොත්, අනෙකුත් සාමාජිකයන් හට එතැන් පටන් තවත් දින 14ක් නිරෝධායනය වීමට සිදුවේ.



ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඉ-තැපැල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

නිවෙස්ගත නිරෝධායනයක් අරම්භ කරන සෑම විටම, ප්‍රදේශයට අදාල මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් එය අදාල ග්‍රාම නිලධාරී වෙත වහාම දැන්විය යුතු අතර නිරෝධායනය ආරම්භ කරන දිනය අනුව පසුදා නිරීක්ෂණය කිරීමට නියමිත නිලධාරියා හටද දැන්වීම කල යුතුය. නිරෝධායන කාලය තුල රාජකාරී ඉටුකල යුතු සෙසු නිලධාරීන් හට දැන්වීම ග්‍රාම නිලධාරී විසින් කලයුතු වේ.

**නිරීක්ෂණ කාර්යයන්**

නිරීක්ෂණ කණ්ඩායමේ නිලධාරීන් තමන්ට අදාල දිනයේ නිවෙස්ගත නිරෝධායනය වන නිවෙස්වලට ගොස් අදාල නිවැසියන් නිවස තුල සිටින බවට තහවුරු කර ගත යුතුය. එසේම ඕනෑම පාර්ශවයකින් පැමිණිලි ඇතොත් එයද විමසා බැලිය යුතුය. නිරීක්ෂණය සඳහා මේ සමග අමුණා ඇති **ආකෘති පත්‍රය** භාවිතා කල යුතු අතර සෑම නිලධාරියෙකු විසින්ම වෙන් වෙන්ව එක් නිවසක් සඳහා එක් ආකෘති පත්‍රයක් භාවිතා කල යුතුය. පොලිස් නිලධාරීන් විසින් දැනටමත් සිදුකරනු ලබන නිරන්තර නිරීක්ෂණ කටයුත්තට අමතරව මෙය සිදුකල යුතුය. සියලු නිලධාරීන් රෝගීන්ගේ හා ආශ්‍රිතයන්ගේ පෞද්ගලිකත්වය හා රහස්‍යභාවය ආරක්ෂා වන පරිදි කටයුතු කිරීමට බැඳී සිටී.

**නියාමනය සහ අධීක්ෂණ කටයුතු**

අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා අපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 21/2020 ප්‍රකාර ප්‍රාදේශීය කමිටුව මගින් මෙම ක්‍රියාවලිය අධීක්ෂණය කලයුතු අතර දිස්ත්‍රික් කමිටුව මගින් නියාමනය කල යුතුය. එසේම නිරීක්ෂණ කටයුතු වල නිරත නිලධාරීන්හට අවශ්‍ය පහසුකම් එම චක්‍රලේඛයේ පරිදි සපයා ගැනීම සිදුකල යුතුය. මෙම නිරීක්ෂණ කාර්යයෙහි නියැලෙන නිලධාරීන් වසංගත රෝගය වැළක්වීමේ සියලු සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම එනම්, දුරස්ථ භාවය, දෑත් පිරිසිදු කිරීම සහ මුඛ හා නාසය ආවරණ පැළඳීම සෑමවිටම තරයේ පිළිපැදිය යුතුය. එමෙන්ම, ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් වරින් වර මෙම ස්ථාන වල නිසි ලෙස නිරෝධානය කටයුතු සිදුවන්නේද, නිරෝධායනය වන පුද්ගලයන් සඳහා ආහාර හා සෞඛ්‍ය ලබා ගැනීමට ඇති පහසුකම්, නිවෙස්වල පවිත්‍රතාවය හා වෙනත් රෝගීන්, වැඩිහිටියන් ආබාධිත පුද්ගලයන් සිටීද යනවග ගැන අවධානය යොමු කල යුතු වේ.

මෙම චක්‍රලේඛය අදාල අමාත්‍යාංශ සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව නිකුත් කරන අතර නිවෙස්ගත නිරෝධායනය නිරීක්ෂණය කිරීම මහගු ජාතික අවශ්‍යතාවයක් බැවින් මෙයට නිසි ලෙස බිම් මට්ටමෙන් ක්‍රියාත්මක වන බවට සහතික කර ගැනීම සඳහා වග බලා ගැනීම අදාල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන ප්‍රධානීන් සහ කලාප හා කොට්ඨාශ භාර අධීක්ෂණ නිලධාරීන්ගේ විශේෂ වගකීමක් ලෙස සලකන ලෙසද, ඍජු අධීක්ෂණයන් වරින්වර කිරීමට කටයුතු කරන ලෙසද අතිගරු ජනාධිපතිතුමා උපදෙස් දී ඇත.

**පී බී ජයසුන්දර**
ජනාධිපති ලේකම්

**පිටපත්:**

1. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
2. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
3. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
4. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්

Serial No: | | | | | | |

# <u>නිවෙස්ගත නිරෝධායානය නිරීක්ෂණය</u>

නිලධාරියාගේ නම:........................................................................................................................ තනතුර:..........................................................................

නිවසේ ලිපිනය: ....................................................................................................................................................................

නිරීක්ෂණයට අදාළ දවස:

| සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා | සෙනසුරාදා | ඉරිදා |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

නිවාස තුල නිරෝධායනය වන අයගේ නම්:

| | | | | |
|---|---|---|---|---|
| 1. | | | 5. | |
| 2. | | | 6. | |
| 3. | | | 7. | |
| 4. | | | 8. | |

| | නිරීක්ෂණය කල දිනය | නිරීක්ෂණය කල වෙලාව | නිරෝධායනයට අනුකූලතාවය දැක්වීම | නිරෝධායනය කඩ කිරීම් | වෙනත් සටහන් සහ යොමුකිරීම් |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |
| 5 | | | | | |

නිලධාරියාගේ අත්සන: ..........................................................

*(සෑම නිලධාරියෙකු විසින්ම, නිරෝධායනය වන එක් නිවසක් සඳහා එක පෝරමය බැගින් පිරවිය යුතුය.)*